www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ලෝක සමාජවාදී වෙබ් අඩවියේ වාර්තාකරු සමග සම්මුඛ සාකච්ඡාවක්

# විසි එක් වන සියවසේ චීනය තුල වෙනස්වන දේශපාලන ආකල්ප

***Interview with WSWS correspondent***

**Changing political attitudes in twenty-first century China**

**Part Two**

**දෙවන කොටස**

**2004 දෙසැම්බර් 8**

*පහත පලවන්නේ වසර ගනනාවකට පසුව ප්‍රථම වතාවට මෑතක දී චීනයේ සංචාරයක යෙදුනු ලෝක* සමාජවාදී වෙබ් අඩවියේ *වාර්තාකරුවකු වන ජෝන් චෑන් සමග පැවති කොටස් දෙකකින් යුත් සම්මුඛ සාකච්ඡාවක දෙවන කොටස යි. චෑන් උපත ලැබුවේ හා හැදී වැඩුනේ එහි දකුනු දිග ගුවාන්ඩොං පලාතේ ය. සිය මෑත ගමනේ දී ඔහු පලාත් අගනුවර වන ගුවාංෂො මෙන් ම තවත් නගර හා ගම්මාන ගනනාවක ම සංචාරය කලේ ය.*

**ලෝසවෙඅ:** චීනය තුල දේශපාලන සාකච්ඡා බෙහෙවින් කෙරෙන්නේ ද?

**ජෝන් චෑන්:** බොහෝ සෙයින් නිල ආයතනවල පවත්නා දූෂනයත් සමාජ ගැටලුත් සම්බන්ධයෙන් පුද්ගලික සාකච්ඡා පවතී. තමන්ගේ ම මිතුරන්ගේ කවයන් තුල දී මිනිස්සු තරමක් විවෘතව කතා කරති.

**ලෝසවෙඅ:** සමාජවාදී මනෝගතියක් ලෙස හැඳින්විය හැකි යමක් ඔබ කෙතරම් දුරට අත්දැක්කා ද?

**ජෝ.චෑ.:** සමානාත්මතාවාදයේ ව්‍යාකූල රූපාකාරයක් එහි පවතී. බොහෝ දෙනාට බටහිර පිලිබඳව මිථ්‍යාවන් ඇත. එක්සත් ජනපදය හා සෙසු බටහිර රටවල පවත්නා සුබසාධන පද්ධතිය සමානතාව අත්පත් කර ගන්නා විධි ක්‍රමයක් යයි ඔවුහු සිතති. එම රටවල දක්නට ලැබෙන දරිද්‍රතාවයේ පරිමාව ගැන මා ඔවුනට පැවසූ කල ඔවුහු කිසිසේත් ම මාව විශ්වාස නො කරන්නට ඇත. එම රටවල අඩු ගනනේ විරැකියා සහනාධාර සහ නිදහස් සෞඛ්‍ය සේවය ඇති බැවින් එහි තතු චීනයට වඩා හොඳ විය යුතු බව බොහෝ දෙනෙක් සිතයි.

"වෙලඳ පොල ප්‍රතිසංස්කරනවල" එල්ලයන් වන්නේ සමාජ සහනාධාර සහ සුබසාධන සේවාවන් ය යන මිථ්‍යාව නිල විද්වතුන්ගේ හා එතෙර "ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ" කොටස් දිගු කලක් තිස්සේ ගසා කා ඇත. පාලක පක්ෂය "දේශපාලන ප්‍රතිසංස්කරන" හරහා යුරෝපීය මාදිලියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් බවට පරිවර්තනය වනු ඇතැයි යන තර්කය පවා සමහරු ඉදිරිපත් කරති.

**ලෝසවෙඅ:** කොමියුනිස්ට් පක්ෂය ගැන මිනිසුන් සිතන්නේ කුමක් ද?

**ජෝ.චෑ.:** ඒ සම්බන්ධයෙන් පවතින්නේ සැබැවින් ම නරුම අදහසකි. පක්ෂයට බැඳුනු අයගේ පවා අදහස එය යි. අද බොහෝ දෙනා, විශේෂයෙන් ම තරුන නිලධාරින්, කියන්නේ පක්ෂයට බැඳිමට තමන් ගත් තීන්දුවට කිසිදු දෘෂ්ටිමය විශ්වාසයක් සමග මොන යම් හෝ සම්බන්ධයක් නැති බව යි. ඔවුන් බැඳුනේ රාජ්‍ය අංශයේ, පරිපාලනයේ හෝ කලමනාකරනයේ රැකියාවක් ලබා ගනු පිනිස ය. සමහරෙක් මා සමග පැවසුවේ, තමන්ට පක්ෂයේ දෘෂ්ටිය සම්බන්ධයෙන් කිසිදු විශ්වාසයක් නැති නිසා එයට බැඳීමට සිදු වීම පිලිබඳව කලකිරීමක් ඇතෙන බව යි. කොමියුනිස්ට් පක්ෂයට කොමියුනිස්ට්වාදය සමග මොන යම් හෝ සම්බන්ධයක් පවතී යයි කිසිවෙක්, දශක ගනනාවක් තිස්සේ පක්ෂයේ සාමාර්කයන්ව සිටි අය පවා, සැබැවින් ම විශ්වාස නො කරයි.

රජය-සතු ව්‍යවසායන්ගේ කම්කරුවෝ තන්ත්‍රය සම්බන්ධයෙන් පොදුවේ දක්වන්නේ සතුරු ආකල්පයකි. 1990 ගනන්වල ප්‍රතිව්‍යුහකරන පිලිවෙත් ඇරඹීමේ පටන් ඔවුන් සිටින්නේ හෙට තමන් දොට්ට වැටෙනු ඇතැයි යන්න පිලිබඳව පවත්නා නිරන්තර බියකිනි. එවන් රැකියා පෙරදී මෙන් සුව පහසු හෝ සුරක්ෂිත රැකියා ලෙස තව දුරටත් නොසැලකෙයි. කලින් මෙම කම්කරුවන්ට රාජ්‍ය නිවාස, විශ්‍රාම වැටුප්, සෞඛ්‍ය සේවා සහ නිදහස් අධ්‍යාපනය යන පහසුකම් තිබුනි.

මම එක් යුවලක් සමග කතා කලෙමි ඔවුන් දෙදෙනා ම වැඩ කලේ රාජ්‍ය-සතු ව්‍යවසායන් තුල ය. තමන් රාජ්‍ය නිවාස පහසුකම් ලැබුනු අවසාන කන්ඩායමට ඇතුලු වූ බැවින් තමන් වාසනාවන්තයන් යයි ඔවුහු මට පැවසූහ. දැන් පවා ඔවුන්ට එහි වියදමින් කොටසක් ගෙවීමට සිදුව ඇත. තමන් කොමියුනිස්ට් පක්ෂයට වෛර කරන බව සැමියා මා සමග පැවසී ය. ඒ මන්දැයි මා විමසූ කල ඔහු කියා සිටියේ පක්ෂය මහජනතාවට බොරු කියන බව යි. රජයේ පාලනය යටතේ පවත්නා

මාධ්‍ය ගෙන යන ප්‍රචාරක ව්‍යාපාරය ඔහුගේ පිලිකුලට ලක්ව ඇත. චීන නායකයන් සිතන්නේ සියලු දෙනා මුග්ධයන් බව යැයි ඔහු කී ය. එහෙත් ඇත්තෙන් ම ඔවුන් එසේ නො වේ. මොවුන් වැනි කම්කරුවන් තන්ත්‍රය සම්බන්ධයෙන් බොහෝ අත්දැකීම් විඳ ඇත.

**ලෝසවෙඅ:** ඔබ පක්ෂ සාමාජිකයන් අතුරින් කවරෙකුට හෝ කතා කලා ද?

**ජෝ.වෑ.:** මා දන්නා එක් අයෙක් වසර 20ක් තිස්සේ කොමියුනිස්ට් පක්ෂය තුල සිටි නිලධාරියෙකි. ඔහු මූල්‍ය ආයතනයක වැඩ කරන අතර කලින් හමුදාවේ ද සිට ඇත. ආන්ඩුවත් ගොවීන් හා කම්කරුවන් මුහුන දෙන සමාජ ප්‍රශ්නත් පිලිබඳව ඔහු බොහෝ දේ දැන සිටියේ ය. ඔහු පෙන්වා දුන් පරිදි, දොට්ට වැටුනු කම්කරුවන්ට චීන ආන්ඩුවෙන් දෙන ඊනියා ජීවන දීමනාව ප්‍රමානවත් වන්නේ සහල් බෑගයක් මිලට ගැනීමට පමනි. කම්කරුවන් හාමතෙන් මිය යාම වැලැක්වීමට පමනක් එය යන්තම් ප්‍රමානවත් ය. එහෙත් බටහිර පවත්නා සුබසාධන ක්‍රමය වඩා හොඳ යන යන මිථ්‍යාව ඔහුට තිබුනි.

නිලධරය තුල තත්වය කොයි වගේ ද යන්න පිලිබඳව ඔහු කියූ කතා වැදගත් ය. තමන් සිය ශේෂ පත්‍රය සම්පූර්න කිරීමට සමත් වුන බවත් කිසිවකු තරහ කර ගත් නැති බවත් එබැවින් තමන් දැඩි සන්තෝෂයෙන් පෙලෙන බවත් දිනක් ඔහු මා සමග පැවසී ය. එය පැහැදිලි කරන ලෙස මා ඔහුගෙන් ඉල්ලා සිටි විට, ඔහු පෙන්වා දුන්නේ දූෂනය සෑම මට්ටමක ම පැතිර පවත්නා තතු යටතේ බැංකුවක ශේෂ පත්‍රය යනු ඉතා පරෙස්සමින් පිලියෙල කල යුතු ලේඛනයක් බව යි. අනෙක් නිලධාරීන්ගේ දූෂන කටයුතු හා නාස්තිය යට ගසනු පිනිස ගිනුම්වල සංඛ්‍යා එහා මෙහා කිරීමට ඔහුට සිදු විය. එය යි හුදු සම්මතය.

නිලධරයන්ගෙන් විශාල සංඛ්‍යාවක් දිරිසුන්, පරපුටු ජීවන චර්යාවක් පවත්වා ගෙන යයි. සෑම වසරක ම ආන්ඩුවේ අයවැයෙන් බිලියන ගනන් නාස්ති කරමින් කමින් බොමින් විනෝද වීම ද ගනිකාවන් ඇසුරු කිරීම ද නිලධරයන්ගේ හා ව්‍යාපාරිකයන්ගේ අනිවාර්ය චර්යාවක් බවට පත්ව තිබේ. සෙසු නිලධාරීන් සමග ඇති වන මතභේදවල දී තමන්ගේ අවශ්‍යතා රැක ගනු පිනිස සිය කාර්ය මන්ඩලය යොදා ගන්නා පොලිස් ප්‍රධානියකු පිලිබඳ කතාවක් මට දැන ගන්ට ලැබුනි. මෙය අසාමාන්‍ය තත්වයක් නො වේ. ඔවුන් ක්‍රියාත්මක වන්නේ මාෆියාවක් මෙනි.

**ලෝසවෙඅ:** ඔබගේ මිත්‍රයා දොස් කීවේ කාට ද?

**ජෝ.වෑ.:** ඔඩු දුවා ඇති දූෂනය පිලිබඳව ඔහු බැන වැදුනේ ඩෙං ෂියාඕපිංට ය. මෙම වසරට යෙදෙන ඩෙංගේ සිය වන උපන් දින සංවත්සර සැමරුම පිලිබඳව මම ඔහුගෙන් විමසීමි. ඩෙං දැන් වෙලඳ පොල ප්‍රතිසංස්කරනවල "මහා නිර්මාතෘ" ලෙස ප්‍රශංසාවට ලක් කෙරෙතත් එය ආරම්භ වූයේ මාඕගේ සමයේ බව ඔහු පැවසී ය. එක්සත් ජනපදය හා බටහිර සමග සංහිඳියාව තහවුරු කර ගැනීමට වෙහෙස වී කටයුතු කලේ මාඕ ය. ඩෙංගේ පිලිවෙත සඳහා ජාත්‍යන්තර පදනම් දැමීමට තුඩු දුන්නේ එම ක්‍රියාකලාපය යි. මාඕ යටතේ 1970 ගනන් මුල දී රෙගුලාසිහරනයේ සමහර රූපාකාරයන් ඒ වන විටත් ක්‍රියාවට දැමෙමින් පැවති බැවින් මාඕ සහ "ධනවාදී මාවත්කාරයන්" අතර අති මූලික වෙනසක් නැතැයි ඔහු අවධාරනය කලේ ය.

**ලෝසවෙඅ:** මෙම සාකච්ඡාව සිදු වූයේ පොදු ස්ථානයක නො වේ?

**ජෝ.වෑ.:** නැත. එය සිදු වූයේ ඔහුගේ නිවසේ ය. මිනිස්සු තව මත් සැකයෙන් යුතුව සිය උරහිස්වලට ඉහලින් හැරී බලති. ඔවුන්ට ආන්ඩුව සමග සමීප සබඳතා තිබිය හැකි නමුත් තමන් කියන දේවල් ගැන ප්‍රවේශම් වීමට ඔවුන්ට සිදු වේ. පැහැදිලිව ම ගැටලුවේ මූලය කරා යාම ඔවුන්ට කල නො හැකි ය. වඩා විවේචනශීලී චීන බුද්ධිමතුන් පවා සලකන්නේ කම්කරු පන්තිය හා පීඩිත ජනතාව දරිද්‍රතාවට යටත් වූ විෂයයන් ලෙස ය — එනම්, ඉහලින් සිටින අය, බොහෝ විට ප්‍රජාතන්ත්‍ර පාලනයක් තහවුරු කරන ප්‍රබුද්ධ පාලකයන් කිහිප දෙනෙකු, විසින් ගලවා ගනු ලැබිය යුතු කොටසක් ලෙස ය.

**ලෝසවෙඅ:** ඔබ ඉන්ටර්නෙට් කැෆේවලට ගියා ද?

**ජෝ.වෑ.:** ඔව්. සෑහෙන ප්‍රමානයක්. පුද්ගලික තොරතුරු බොහොමයක් සැපයීමට මට සිදු වනු ඇතැයි මම සිතුවෙමි. එහෙත් ගැටලුව එය නො වේ. ඉන්ටර්නෙට් පොලීසියක් සහ නීති හා රෙගුලාසි පවතී. ඔවුහු විටින් විට මිනිසුන් අත් අඩංගුවට ගනී. එහෙත් එය ඇත්ත වසයෙන් ම හුදු ප්‍රදර්ශනය උදෙසා ය. ඉන්ටර්නෙට් භාවිතය සීමා කිරීමට හෝ පාලනය කිරීමට එය කිසිසේත් ම ඵලදායි ලෙස සමත් නො වේ. එතරම් විශාල සංඛ්‍යාවක් අන්තර්ජාලයට පිවිස සිටින බැවින් එවන් දෙයක් කෙසේ වෙතත් කල හැක්කක් නො වේ. බොහෝ පවුල්වලට තමන්ගේ ම අන්තර්ජාල සම්බන්ධතා ඇත. සැලකිය යුතු සංඛ්‍යාවකට පුලුල් ධාරිතාවකින් යුත් අන්තර්ජාල සම්බන්ධතා පවතින අතර ගනනාවක් එක ම ගොඩනැගිල්ලක සම්බන්ධතාවක් පොදුවේ භාවිතා කරයි.

බොහෝ තරුනයන් ඉන්ටර්නෙට් කැෆේ භාවිතා කරන අතර එය තරමක් ලාභ ය — පැයකට යුවාන් දෙකක් හෝ තුනකි. එම ස්ථාන නිතර ම පිරී පවතී. රෙගුලාසිවල සඳහන් වන්නේ ඔබ අවුරුදු 18ට වැඩි විය යුතු අතර ඔබගේ හැඳුනුම්පත එහි සිටින අධීක්ෂකයාට පෙන්විය යුතු බව යි. එහෙත් භාවිතයේ දී කිසිවෙක් මෙම රෙගුලාසිවලට එතරම් අවධානයක් යොමු නො කරයි. ඔබට අංකයක් ලබා දෙන අතර, අන්තර්ජාලය තුල කවුරු මොනවා කලා ද යන්න සොයා ගැනීම ඉතා අසීරු බව මට නිසැක ය.

**ලෝසවෙඅ:** එහි පවතින රූපවාහිනී, ගුවන් විදුලි සහ පුවත් පත් වාර්තාකරනය පිලිබඳ ඔබට ඇනුනේ කුමක් ද?

**ජෝ.වෑ.:** ගුවාංෂො සහ යාබද ප්‍රදේශවල රූපවාහිනී

නාලිකා 50ක් පමන ඇත. හොංකොං සිට විකාශනය කෙරෙන නාලිකා ද මෙයට ඇතුලත් ය. එහෙත් පුලුල් පරාසයක වැඩසටහන් නැරඹීම සඳහා අවශ්‍ය කෙරෙන පොදු කේබල් ජාලය පාලනය කරන්නේ ආන්ඩුව යි. නිදසුනක් ලෙස, බෙයිජිං පාලනයට අහිතකර යමක් හොංකොං රූපවාහිනිය මගින් වාර්තා කෙරෙන්නේ නම්, එය නතර කොට ඒ වෙනුවට ගීත වාදනය කෙරෙයි. එනිසා ගීත ප්‍රචාරය වීම ඇරඹෙන විට ම රාජ්‍ය වාරනය වැඩට බැස ඇති බව මිනිස්සු දැන ගනිති.

**ලෝසවෙඅඃ** ප්‍රවෘත්ති වාර්තාකරනය කොයි වගේ ද?

**ජෝ.චැ.ඃ** පොදුවේ ගත් කල, වඩා විවේචනශීලී අදහස් දැක්වීම් කෙරෙන්නේ රූපවාහිනියට වඩා පුවත් පත්වල ය. සමහර පුවත් පත්, විටින් විට සමහර සමාජ කොන්දේසි — පතල් අනතුරු හෝ රෝහල්වල කොන්දේසි හා සෙසු බේදවාචක වැනි දේ — විවේචනය කරමින්, යන්තමින් ලිබරල් ස්වරූපයක් ගනී. තරුන මාධ්‍යවේදී පරපුර සමාජ ව්‍යසනයන් එළිදරව් කිරීමට මැලි නො වෙති. එහෙත් නිතරම පාහේ තන්ත්‍රය විසින් ඔවුහු විනයගත කෙරෙති. එය කෙසේ වෙතත්, සමාජ හා ආර්ථික ජීවිතය නවීන තාක්ෂනය හා සෙසු ලෝකය සමග බෙහෙවින් ඒකාග්‍ර කෙරී ඇති තතු යටතේ ප්‍රවෘත්තිවලට හා දේශපාලන අදහස්වලට ප්‍රවිෂ්ට වීම සීමා කිරීම වඩ වඩා දුෂ්කර ය.

**ලෝසවෙඅඃ** ජාතිකවාදය බෙහෙවින් ප්‍රමුඛව පවතී ද?

**ජෝ.චැ.ඃ** ඔව්, එය බෙහෙවින් ප්‍රමුඛව දක්නට ලැබේ. චීන ජාතිකවාදය සෑම තැනක ම ප්‍රදර්ශනය කෙරේ. වීදිවල බොහෝ ප්‍රචාරක පුවරු දක්නට ලැබේ. හමුදාවට සහාය දෙන ලෙස මහජනතාව උනන්දු කරන විශාල චීන අකුරුවලින් යුත් පුවරු නිවහන් ප්‍රදේශවල ප්‍රදර්ශනය කෙරේ. එහෙත් තරුනයන් හා කම්කරුවෝ මේ ආකාරයේ ප්‍රචාරයන් ගැන තරමක් සතුරු ආකල්පයක් දරති. ඔවුහු ඒවා නිලධරය සමග අනන්‍ය කර ගනිති.

**ලෝසවෙඅඃ** මහජනතාව ලෝක සිද්ධීන් පිලිබඳව බෙහෙවින් දැනුවත් ද?

**ජෝ.චැ.ඃ** එය සමාජ ස්ථරය මත රඳා පවතී. පොදුවේ ගත් කල, තරුනයන් අතර, බටහිර ද්‍රව්‍යමය සංස්කෘතිය හා පශ්චාත්-යුද කාල පරිච්ඡේදයේ සමාජ ප්‍රතිසංස්කරන පිලිබඳව ඇවැන්ත මිථ්‍යාවන් පවතී. කෙසේ වෙතත්, ඉරාකය තුල එක්සත් ජනපද ආක්‍රමනය සම්බන්ධයෙන් මිථ්‍යාවන් පවතින්නේ මද වසයෙනි. බොහෝ දෙනා ඉරාක යුද්ධය පිලිබඳව විවේචනශීලී වන අතර එක්සත් ජනපදය එහි කුමක් කරන්නේ ද යන වග දනී. යුද්ධය තෙල් හා බලය පිලිබඳව බවත් දුප්පත් රටක් ආක්‍රමනය කිරීමක් බවත් සෑම කෙනෙක් ම සිතයි.

1996 දී එක්සත් ජනපද ගුවන් යානා ප්‍රවාහන නෞකා දෙකක් තායිවාන සමුද්‍ර සන්ධිය තුල සේවයේ යෙදවීම, 1999 දී යුගෝස්ලාවියාවේ චීන තානාපති කාර්යාලයට එල්ල වූ එක්සත් ජනපද ප්‍රහාරය සහ 2000 දී එක්සත් ජනපද ඔත්තු බලන යානයක් චීන ජෙට් යානාවක් සමග ගැටීම යන මේ සියල්ල ම එක්සත් ජනපදය සම්බන්ධයෙන් චීන ජනතාවගේ ආකල්පය මත බලපෑමක් ඇති කලේ ය. මගේ පැරනි පාසල් මිතුරන්ගෙන් සමහරෙක් 1999 දී එක්සත් ජනපද තානාපති කාර්යාලය ඉදිරිපිට පැවති විරෝධතාවන්ට සහභාගි විය.

**ලෝසවෙඅඃ** රාජ්‍ය-සතු රූපවාහිනිය තුල එක්සත් ජනපද විරෝධී ආකල්පයක් දිරිමත් කෙරෙන්නේ ද?

**ජෝ.චැ.ඃ** චීන ආන්ඩුව ජාතිකවාදය ප්‍රචාරය කරනු පිනිස මෙම සිද්ධීන් අරබයා පැන නැගුනු ස්වයං-සිද්ධික වෛරය ගසාකෑමට උත්සාහ කලේ ය. කෙසේ වෙතත්, මහජන මතය පාලනය කිරීමෙහි ලා ආන්ඩුව වැඩි වාසි සහගත ස්ථානයක සිටී යයි සිතීම වැරද්දක් වනු ඇත. තන්ත්‍රයේ ජාත්‍යන්තර ප්‍රාග්ධනයට දොර විවෘත කිරීමේ පිලිවෙත මගින් නිර්මානය කෙරෙන සමාජ දුක්ගැනවිලි සමග ජාතිකවාදී මනෝගතීන් සාමාන්‍යයෙන් බැඳී පවතී. චීන අපනයනවලට විරුද්ධව එක්සත් ජනපදය පනවා ඇති ආරක්ෂනවාදී සම්බාධකවල ව්‍යසනකාරි බලපෑම කම්කරුවන් මෙන් ම ගොවීන් අතර ද අමනාපයක් වර්ධනය කොට ඇත.

චීන ඉස්සන් අපනයනය තහනම් කිරීමට බුෂ් ආන්ඩුව ගත් තීන්දුව සම්බන්ධයෙන් කෝපයට පත්ව සිටින ගොවි කාන්තාවක සමග මම ඉතා සිත් ගන්නා සාකච්ඡාවක් පැවැත්වීමි. දේශීය සමාගම් ඇයගේ ඉස්සන් මිලට ගෙන ඒවා සකස් කොට එක්සත් ජනපදයට අපනයනය කිරීමට පුරුදුව සිටියේ ය. දැන් ඔවුහු සිය ගැනුම් මිල කප්පාදු කොට ඇති අතර ඇය දරිද්‍රතාවට ඇද වැටී තිබේ. ඇය එවිට ඉරාකය තුල යුද්ධය සම්බන්ධයෙන් එක්සත් ජනපදය කෙරෙහි සිය වෛරය ප්‍රකාශ කිරීමට ද පටන් ගත්තා ය. චීන ගොවි කාන්තාවකට එලෙස ලෝක තතු ගැන කතා කරන්නකු බවට පත් වීම එක්තරා ආකාරයක වෙනසකි.

**ලෝසවෙඅඃ** සමාජවාදය හෝ ට්‍රොට්ස්කිවාදය පිලිබඳ කාරනාව සාකච්ඡා තුල දී මතු වූයේ ද?

**ජෝ.චැ.ඃ** බොහෝ දෙනෙක් ලියොන් ට්‍රොට්ස්කි ගැන අසා නැත යන්න පැහැදිලි ය. සමාජවාදය සාමාන්‍යයෙන් ස්ටැලින්වාදය සමග අනන්‍ය කෙරෙයි. තන්ත්‍රය කෙරෙහි පවත්නා වෛරය හේතු කොට ගෙන බොහෝ දෙනෙකු සමග සමාජවාදය පිලිබඳව බැරෑරුම් සාකච්ඡාවක් පැවැත්වීම දුෂ්කර ය.

**ලෝසවෙඅඃ** ට්‍රොට්ස්කිගේ පොත් එහි අලෙවියට තබා තිබේ ද?

**ජෝ.චැ.ඃ** නැත. සාමාන්‍ය පොත් සාප්පුවල නම් නැත. එහෙත් ෂින්හුවා වැනි නිල රාජ්‍ය-සතු පොත් හල්වල ඒවා ඇත. ට්‍රොට්ස්කිවාදය ගැන පොත් කිහිපයක් තිබේ. ඒවායින් සමහරක් තරමක් සිත් ගන්නා සුලු ය. වැන් ෆැන්ස්කි හා ෂෙන් චඖලිං වැනි හිටපු චීන ට්‍රොට්ස්කිවාදීන්ගේ ලේඛන මාලාවක් පල කොට තිබේ.

ෂෙන් 1950 ගනන්වල දී මාඕ විසින් සිරගත කෙරුනු අතර නිදහස් කෙරුනේ 1970 ගනන් අග දී ය. 1940 ගනන්වල දී චීන ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ නායක පෙං ෂුශිගෙන් ඔහු භේද වීමට ප්‍රථම වැන් ෆැන්ස්කි එම ව්‍යාපාරයේ නායකත්වයේ සිටියේ ය. වසර කිහිපයකට ඉහත දී ඔහු එංගලන්තයේ දී මිය ගියේ ය. මම තව මත් එම පොත් පරෙස්සමින් කියවා බලා නැත. එහෙත් මෙම ලේඛන මාලාවට සපයා තිබූ හැඳන්වීමෙහි සඳහන් වූයේ සෝවියට් සංගමය බිඳ වැටීමෙන් පසුව, ස්ටැලින්වාදය සැබෑ විද්‍යාත්මක කොමියුනිස්ට්වාදය හෝ සමාජවාදය නො වේ යයි තර්ක කරන අයව තේරුම් ගැනීමෙහි ලා මෙම කතුවරුන්ගේ ලේඛන උදව්කාරක විය හැකි බව යි. තම මරනය තෙක් ම සිය සංකල්ප සම්බන්ධයෙන් කිසි දාක නොවැනුනු ට්‍රොට්ස්කිවාදියකු ලෙස වැන් සැලකෙයි.

**ලෝසවෙඅ:** මෙම පොත් ඕනෑම කෙනෙකුට මිලට ගත හැකි ද?

**ජෝ.චෑ.:** එය පැහැදිලි නැත. මෙම පොත් ඉදිරියෙන් පැවති පුවරුවක සඳහන් වූයේ ඒවා පර්යේෂන කටයුතුවල යෙදෙන කාඩර්වරුන් සඳහා පමනක් සැපයෙන අභ්‍යන්තර ප්‍රකාශන බව යි. ඒවා මිලදී ගැනීමට නම් තමන් විද්වතකු බව ඔප්පු කල යුතු යයි මම උපකල්පනය කරමි.

චීනයේ බොහෝ දෙනෙක් චීන ට්‍රොට්ස්කිවාදීන් ගැන කිසිදාක අසා නැතිවා විය හැකි ය. එහෙත් මෙම පොත් පල කිරීම මගින් පෙන්නුම් කෙරෙන්නේ, අඩුම ගනනේ, ට්‍රොට්ස්කිවාදයේ බලපෑම පිලිබඳව තන්ත්‍රය තුල උත්සුකතාවක් පවත්නා බව යි. අන් සියල්ලට මත් වඩා, ඔවුන්ගේ දේශපාලනික යුක්තියුක්ත භාවය තව මත් රදා පවතින්නේ තමන් සමාජවාදය හෝ කොමියුනිස්ට්වාදය නියෝජනය කරන බවට කෙරෙන සාවද්‍ය කියාපෑම මත ය.

එහි දී මා දුටු තවත් පොතක් 1920 ගනන්වල කොමියුනිස්ට් පක්ෂය සහ කුවෝමින්ටැනය අතර සහයෝගිතාව පිලිබඳව ලියැවුන එකකි. මෙම ඉතිහාසය ද විද්වතුන්ගේ උනන්දුවට භාජනය වූ මාතෘකාවක් බවට පත්ව ඇත. කොමියුනිස්ට් පක්ෂය කුවෝමින්ටැනයට යටත් කිරීමේ ස්ටැලින්ගේ පිලිවෙත දෙවන චීන විප්ලවයේ (1925-27) ඛේදවාචකය නිර්මානය කලේ ය යන්න දැන් විවෘතව පිලිගැනෙන කාරනාවකි.

එහෙත් ඔබට එයින් ඔවුන් උකහා ගන්නා නිගමනය මුලුමනින් ම පාහේ පෙර දැකිය හැකි ය: 1927 පරාජය ඛේදවාචකයකි. එහෙත් එහි පාඩම් උකහා ගත්තේ මාඕ ය. ධනවාදී වර්ධනයේ ප්‍රමාදය නිසා චීන කම්කරු පන්තිය ප්‍රජාතන්ත්‍ර හා ජාතික අරගලය ගෙන යාමට නොහැකි තරම් සංඛ්‍යාත්මකව දුර්වලව සිටියේ ය. එනයින් ගත් කල, ගොවි ජනතාව හා ධනේශ්වරයේ කොටස් වෙත හැරීම අවශ්‍ය විය — 1949 දී මාඕ බලයට ගෙන ආවේ එම මූලෝපාය මගිනි. මෙම තර්කය මාඕවාදය සඳහා සැපයෙන නිල ක්ෂමාලාප සම්බන්ධයෙන් නියාමාකාරයෙන් නිදර්ශනාත්මක ය. ඇත්ත වසයෙන් ම, එය පදනම් වන්නේ මාක්ස්වාදය හා සැබෑ සමාජවාදය මුලුමනින් ම ප්‍රතික්ෂේප කිරීමක් මත ය.

© www.wsws.org